**ලංකා ගවර්මන්ට් ඉන්ෆොමේෂන් ඉන්ෆ්‍රාස්ට්‍රක්චර් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකා ගවර්මන්ට් ඉන්ෆොමේෂන් ඉන්ෆ්‍රාස්ට්‍රක්චර් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේවාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ සියළුම කාර්යමණ්ඩලය 2023 ජුනි 01 දින සිට මව් සමාගමවන ඉන්ෆෝමේෂන් කොමියුනිකේෂන් ටෙක්නොලොජි ඒජන්සි ඔෆ් ශ්‍රී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමවෙත අනුයුක්ත කිරීම හේතුවෙන් පාරිතෝෂික වෙන්කිරීම ගිණුමේ සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවැති රු. 5,078,752ක් වූ ශේෂය, සමුච්ත ශේෂයට ගලපනු වෙනුවට ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 01 හි 07 වන ඡේදයේ නියමයන්ට අනනුකූල වන පරිදි වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශයට ගැලපීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ විස්තීරණ ආදායම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | සේවකයින් මාරු කිරීම හේතුවෙන් පාරිතෝෂික ප්‍රතිපාදනය ශුන්‍ය අගයක් දක්වා වෙනස් වීම LKAS 8 යටතට නොවැටෙන අතර, එබැවින් ප්‍රතිගාමී ගැලපීම් අනවශ්‍ය වේ. | ප්‍රමිතය ප්‍රකාරව විස්තීරණ ආදායම් ප්‍රකාශයට ගැලපිය යුතු ශේෂ පමණක් ගැලපිය යුතුවේ. |

**1.5.2 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 නොවැම්බර් 15 වැනි දින පැවති මව් සමාගමේ (ඉන්ෆෝමේෂන් කොමියුනිකේෂන් ටෙක්නොලොජි ඒජන්සි ඔෆ් ශ්‍රී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්) හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සමාගම් පනතේ 242 වගන්තියට අනුව සමාගම ඉන්ෆෝමේෂන් කොමියුනිකේෂන් ටෙක්නොලොජි ඒජන්සි ඔෆ් ශ්‍රී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමඟ ඒකාබද්ධ කිරීමට අනුමැතිය ලබා දී තිබුණ ද 2024 අප්‍රේල් 30 දක්වා එම කාර්යය සම්පූර්ණ කර නොතිබුණි. | මූල්‍ය ගිණුම් ප්‍රමාද වීම හේතුවෙන් ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද විය. | කළමණාකරණ තීරණ අනුව කටයුතු කළ යුතුය. |

## 1.6. ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට මව් සමාගමෙන් (ඉන්ෆෝමේෂන් කොමියුනිකේෂන් ටෙක්නොලොජි ඒජන්සි ඔෆ් ශ්‍රී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්) ලැබිය යුතු ශේෂය රු.44,001,286 ක් වූ අතර එය 2015 වසරේ සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | LGII, ICTA සමඟ ඒකාබද්ධ කිරීමේ අඛණ්ඩ ක්‍රියාවලිය හරහා මෙම අන්තර් සමාගම් ශේෂය පියවා ගැනීමට ICTA සැලසුම් කර ඇත. | ලැබියයුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7. නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 133(1) වගන්තිය | පනත ප්‍රකාරව එක් එක් ලිත් වර්ෂයකටම වරක් කොටස් හිමියන්ගේ වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්විය යුතු නමුත් 2017 වර්ෂයේ සිට සමාගම වාර්ෂික මහා සභා රැස්වීම පවත්වා නොතිබුණි. | 2019 සිට 2022 වසර සඳහා මූල්‍ය ගිණුම් සැකසීමේ ප්‍රමාදය වාර්ෂික මහා සභා රැස්වීම (AGM) කැඳවීම ප්‍රමාද වීමට හේතු වී තිබේ. | පනත ප්‍රකාරව ලිත් වර්ෂයකට වරක් වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්විය යුතුය. |
| ආ) 2021 නොවැම්බර් 16 දිනැති අංක:01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.2.2 ඡේදය | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවම වශයෙන් මසකට වරක්වත් නිතිපතා පවත්වන බවට සමාගමේ සභාපති සහතික විය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ සමාගම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 02ක් පමණක් පවත්වා තිබුණි. | LGII කාර්යයන් ICTA හි ඩිජිටල් සේවා අංශය වෙත මාරු කර ඇති බැවින්, කිසිදු මෙහෙයුම් ක්‍රියාකාරකම්වල නිරත වී නොමැත. ඊට සමගාමීව, LGII ICTA සමඟ ඒකාබද්ධ වීමට නිල වශයෙන් තීරණය කර ඇති අතර දැනට ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියේ පවතී. | මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ඇ) 2021 නොවැම්බර් 16 දිනැති අංක:01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.3 ඡේදය | සමාගම සමාලෝචිත වර්ෂය සඳහා අයවැය පිළියෙළ කර නොතිබුණි. | LGII හි ශ්‍රම බලකාය සමන්විත වූයේ සේවකයින් හත් දෙනෙකුගෙන් පමණක් වන අතර LGII මෙහෙයුම් ICTA හි ඩිජිටල් සේවා ස්ථම්භය යටතට ගෙන ඇති බැවින් ඔවුන්ගේ ආශ්‍රිත පිරිවැය ICTA අයවැයට පාදක කර ඇත. | මාර්ගෝපදේශය ප්‍රකාරව වර්ෂය සඳහා අයවැය පිළියෙළ කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය ශූන්‍ය වූ අතර ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 2,133,248 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,133,248 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාගමේ කාර්යමණ්ඩල පිරිවැය අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය නොමැතිව 2023 මැයි 31 දින පැවැති මව් සමාගමේ (ඉන්ෆෝමේෂන් කොමියුනිකේෂන් ටෙක්නොලොජි ඒජන්සි ඔෆ් ශ්‍රී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය මත පමණක් සත් දෙනෙකුගෙන් සමන්විත සමාගමේ කාර්ය මණ්ඩලය මව් සමාගමේ කාර්ය මණ්ඩලය සමඟ ඒකාබද්ධ කර තිබුණි. | මෙම තීරණය ගනු ලැබුවේ නොවිසඳුණු මූල්‍ය ගිණුම් නිසා ඇති වූ ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියේ ප්‍රමාදයන් සහ LGII සේවකයින්ට වැටුප් නොගෙවා ICTA සේවකයින් වෙත වැටුප් ගෙවීම සීමා කිරීම සඳහා තාක්ෂණ අමාත්‍යාංශයෙන් ද (MOT) දන්වා තිබු නිසාය. | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ද අනුමැතිය ලබාගත යුතුවේ. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.350,742 ක් වූ ලංකා බැංකුවේ අංක 0072839158 දරන බැංකු ගිණුමේ බැංකු ශේෂය 2020 දෙසැම්බර් 31 සිට වසර තුනක පමණ කාලයක් භාවිතාකර නොතිබුණි. | මෙම ශේෂය 2024 මාර්තු 18 දින ICTA වෙත මාරු කර ඇත. | අරමුදල් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 දෙසැම්බර් 14 දිනැති අංක: පීඊඩී 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 15 වන ඡේදය ප්‍රකාරව අවම වශයෙන් මාස තුනකට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | LGII ICTA සමඟ ඒකාබද්ධ වීමට නිල වශයෙන් තීරණය කර ඇති අතර දැනට ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියේ පවතී. එහි ක්‍රියාකාරී නොවන තත්ත්වයන් යටතේ, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කැඳවීමේ අවශ්‍යතාවයක් නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |